සන්නස




# ඇඩ්ස්

**අවසන් කොටස**

ජගත් ජේ එදිරිසිංහ ලියයි

> **"ඒ මනුස්සය කොයි තරම් අසරණ වෙලාද කියල ඇස් දෙකෙන්ම දැක්කම හිතට දුකක් ආවා.. රජෙකුට වුණත් හිඟන්නෙකුගෙ තැනට ඇදගෙන වැටෙන්න මහ කාලයක් යන්නෙ නැහැ නේද කියන එක හිතට ආවා.. එක වෙලාවකට හිතාගන්නවත් බැහැ එහෙම දෙයක් වෙන්න පුලුවන්ද කියල.. එහෙම වෙන්නෙ කොහොමද සුනන්ද..?**

"හිත අධෛර්ය කරගන්න එපා..." වින්ධ්‍යා කියන්නේ යමක් කිව යුතු නිසා ය.

දුර්වර්ණව ගිය කම්බි කූරු අතරින් පෙනෙන වින්ධ්‍යා ගේ රුව එදා පළමු වතාවට දුටු දා සේ ම පියකරු යයි රණසිංහට සිතෙයි. තමා බලන්නට බන්ධනාගාරයට ආ ඇගේ මේ ගමන ඔහු තුළ ඇති කරන්නේ විමතියකි. දික්කසාදයෙන් පසු කිසි දිනෙක ඇය මෙසේ මුණ ගැසෙනු ඇතැයි අංශු මාත්‍රයක හෝ බලාපොරොත්තුවක් ඔහුගේ සිතේ නොවී ය. ඇගේ මුහුණ බලා යමක් කියන්නට නොහැකි අපහසුතාවක් ඔහු සිත තුළ දලු ලා වැඩෙයි. ඔහු වින්ධ්‍යා වෙතින් දෑස් ඉවතට ගනියි. කාමරයේ ඉහළ මුල්ලකට වී දැලක් වියමින් සිටින මකුළුවා ඔහුට පෙනෙයි.

"ඔයා මේ අමාරුවෙ වැටෙන බව මම දැනගෙන හිටියා.." යි වින්ධ්‍යා සිතින් කියයි.

"මට මේකෙන් ගැලවුමක් නැහැ වින්ධ්‍යා.." ඔහු ගේ කටහඬ ඇයට ඇසෙන්නේ බොහෝ ඈතක සිට කතා කරන්නාක් මෙන් ය.

ඔහුට මෙයින් ගැලවුමක් නැති බව ඇය ද දනියි. අයේෂාගේ කුසෙහි සිටියේ රණසිංහ ගේ දරුවා බව ඩීඑන්ඒ පරීක්ෂණය සාක්ෂි දරනු ඇති බව ඇය දනියි. අයේෂා ගේ හිස හරහා ගොස් තිබූ උණ්ඩය රණසිංහ ගේ පිස්තෝලයෙන් පිටවූ එකක් බව රස පරීක්ෂක වාර්තාව කියන බව මේ වන විටත් වාර්තා වී ඇත.

"මම මේ මිනීමැරුම කළේ නැහැ වින්ධ්‍යා.." ඔහු අපහසුවෙන් හිස ඔසවා ඇය දෙස බලා කියයි. ".. මං මේකට කොහෙත්ම සම්බන්ධ නැහැ.."

ඔහු කියන්නේ සත්‍යය වන්නට ඇතැයි විශ්වාස කරන්නට වින්ධ්‍යා කැමති ය. එහෙත් රණසිංහට නීතියෙන් ගැලවීමක් නොලැබෙනු ඇති බව සහතික ය. නීතිය ඉදිරියේ අනුකම්පාව යනු තවත් එක් වචනයක් පමණකි.

"වෙඩි තියල තියෙන්නෙ ඔයාගෙ පිස්තෝලෙන්.."

"ඔව්.. එහෙමයි කියන්නෙ.. ඒත් පොලිසිය එනකොටත් ඒක මගේ කාමරේ ලාච්චුවෙ තිබුණා.. කවුරු හරි මගේ පිස්තෝලෙ හොරකම් කරගෙන වෙඩි තිබ්බා නම් ඒක ආපහු මගේ කාමරේට ආවෙ කොහොමද..?"

වින්ධ්‍යා ගේ මුවේ නැගෙන අවඥා සහගත සිනාව දරා ගත නොහැකිව රණසිංහ දෑස් ඉවතට ගනියි.

"ඕව තේරුම් ගන්න බැරි ප්‍රශ්න නෙවෙයි රණේ.. බලකාමයෙන් අන්ධ වුණ මිනිස්සුන්ව අමාරුවෙ දාන එක හරිම පහසුයි.. මොනා වුණත් හිත වට්ටගන්න එපා.. මිනිස්සුන්ටනෙ හැම දේම වෙන්නෙ.."

පෙරදින රණසිංහ බලන්නට ආ පොඩි හාමුදුරුවන් කීවේද එවන් වදනකි. උන්වහන්සේ සිටියේ සුපුරුදු හැඟීම් විරහිත දැසින් ඔහු දෙස බලාගත්වනම ය. රණසිංහ සිටියේ කෙලින් උන්වහන්සේ ගේ මුහුණ දෙස බලනු නොහැකිව බිම බලා ගත්වනම ය.

"න චාහු න ච භවිස්සති

න චේතරහි විජ්ජති

ඒකන්තං නින්දිතෝ පෝසෝ

ඒකන්තං වා පසංසිතෝ

තනිකරම නින්දා ලැබුවකු හෝ ප්‍රශංසා ලැබූවකු හෝ පෙර හිටියෙත් නැහැ.. මතු බිහිවන්නෙත් නැහැ.. දැන් ඉන්නෙත් නැහැ මහත්තයා.. ඒක ලෝක ස්වභාවය.. මං ආවෙ මහත්තයට බණ කියන්න නෙවෙයි.. මහත්තයගෙ හිතට පොඩ්ඩක් හරි ශක්තියක් ලබා දෙන්න පුලුවන් නම් ඒක දීලා යන්න.."

වින්ධ්‍යා අත්බෑගය අතට ගනියි. "..මම යන්න ඕනෙ.." ඕ මොහොතකට නැවතී ඔහුගේ මුහුණ බලයි. ".. මට කියන්න යමක් තියෙනවා.."

ඔහු හිස ඔසවා ඈ දෙස බලන්නේ ප්‍රශ්නාර්ථයක් රැඳුණ ඇසින් ය. කියන්නට ආ දෙය එකවරම නොකියා ඕ ඔහු ගේ මුහුණ මගහැර පටුපස බිත්තිය දෙස නෙත් හෙළයි.

"මම ඉක්මණින් මැරි කරනවා.. "

ඔහු අනායාසයෙන් සුසුමක් පිට කරයි. එක නිමේෂයකට ඔහුගේ දෑසග ඇකිලෙයි.

"සතුටුයි.." ඔහු පහත් හඬින් කියයි. "..අවංකවම සුබ පතනවා.."

වින්ධ්‍යා නැගී සිටියි. ඇය ගෙන ආ කෑම පාර්සලය, බන්ධනාගාර නියාමකවරයා කවුළුව හරහා රණසිංහ වෙත තල්ලු කර යවයි.

"අධෛර්ය වෙන්න එපා.. අපි පුලුවන් විදිහකට උදව් කරන්නම්.." වින්ධ්‍යා පිටව යන්නට පෙර කියූ අවසන් වදන් ඔහු සිත තුළ දෝංකාර දෙයි. මතක ඇති කාලයක පළමු වතාවට ඔහුගේ දෑස් කඳුලෙන් පිරෙයි.

දැරිය නොහැකි හුදකලාවක් ඔහු වෙළාගෙන ඇත. උසාවිය විසින් වැරදිකරුවකු කරනු ලබන්නටත් පෙර ම පක්ෂය ඔහුගේ සංවිධායකධුරය අහෝසි කර ඇතිබව දැනගත්තේ ඊයේ ය. නව සංවිධායකවරිය ලෙස අයෝමා පත්ව ඇති බවත් ඒ සමග ම ආරංචි විය.

ප්‍රඥාරත්න හෝ අයෝමා හෝ හමුවූ දිනක් සිහියට නගා ගන්නටත් බැරි තරම් ය. අවම වශයෙන් අජිත් හෝ තමා දකින්නට එනු ඇතැයි ඔහු සිත වූ බලාපොරොත්තුවද දැන් ක්ෂය වෙමින් පවතියි. තමා වැළඳගෙන සිටි සියල්ලන්ම තමා බැහැර කර ඇති මොහොතක, තමාට එපාව ගිය ගැහැණිය ගේ ආගමනය, ඔහුගේ දැඩි සිත සිඳ බිඳ දමයි. දෑතින් මුහුණ වසාගත් ඔහු ජීවිතයේ පළමු වරට ඉකි බිඳිමින් හඬයි.

000000

වින්ධ්‍යා වාහනයේ ඉදිරි අසුනේ වාඩි වන්නේ කතාබහකින් තොරවම ය. ඇගේ මුහුණේ ඇඳී ඇති කණගාටුව රියැදුරු අසුනේ වාඩිව සිටින සුනන්දට පෙනෙයි. ඒ පිළිබඳ ඊර්ෂ්‍යාවක් හෝ වෙනත් නොපහන් හැඟීමක් හෝ ඔහුගෙ සිතේ ඇති නොවෙයි. ඔහු සිය වමත ඇගේ දකුණතේ පිටි අත්ල මත තබයි.

"කණගාටුවෙන්න එපා.." ඔහු කියයි. ඕ සිය වමත ඔහුගේ අත මත තබයි. ඕ හැරී ඔහු දෙස බලයි.

"ඒ මනුස්සය කොයි තරම් අසරණ වෙලාද කියල ඇස් දෙකෙන්ම දැක්කම හිතට දුකක් ආවා.. රජෙකුට වුණත් හිඟන්නෙකුගෙ තැනට ඇදගෙන වැටෙන්න මහ කාලයක් යන්නෙ නැහැ නේද කියන එක හිතට ආවා.. එක වෙලාවකට හිතාගන්නවත් බැහැ එහෙම දෙයක් වෙන්න පුලුවන්ද කියල.. එහෙම වෙන්නෙ කොහොමද සුනන්ද..?"

"තමන් ඉස්සරහ අවදානමක් ගොඩ නැගෙමින් තියෙනවා නම් ඒක කලින්ම තේරුම් ගන්න හැකියාවක් දේශපාලනඥයෙකුට තියෙනන්න ඕනෙ.. ඒක තමයි ඒ මිනිහගෙ දක්ෂකම.. තමන් ළඟ අවදානමක් ගොඩ නැගෙන හැටි රණසිංහ දැක්කෙ නැහැ.. එයා ළං කරගත්ත එහෙයියොවත් ඒක පෙන්නලා දෙන්න තරම් අවංක වුණේ නැහැ.. එහෙමත් නැත්නම් හැමෝම එකතු වෙලා මේ දැල මේ මිනිහ වටේ එලුවා.."

වින්ධ්‍යා සීරුවෙන් ඔහු දෙසට බර වී උරහිස මත හිස තබාගනියි.

"මේ හැම දෙයක් ගැනම මට පුදුමයි.."

ඔහු හිස පහත් කොට ඇගේ හිස සිප ගනියි.

"අපි යමු.."

"අදම එනව කියල මල්ලිට පොරොන්දු වුණේ නැත්නම් අපට අද මෙහෙ ඉන්න තිබුණා.." ඕ ඔහු වෙතින් ඉවත්වන අතර කියයි. "... කොහෙද ඉතින්.. කුසල්ට ඔයා නැතුව කිසිම වැඩක් කරන්න බැහැනෙ.. "

"මං හොඳ මස්සිනා කෙනෙක් කියලා කුසල් දන්නවා.. "

"හොඳයි හොඳයි.. දෙමස්සිනාලගෙ බිස්නස් එක නැගලා ගියොත් ඉතින් අපටත් වාසියක් වෙයිනෙ.."

"ගියොත් කියලා අඩමානෙට කියන්න එපා.. ඒක නැගලා යනවාමයි.. ආයෙ සැකයක් තියාගන්න එපා ඒ ගැන.."

"ඒ ගැන කිසිම සැකයක් නෑ මහත්තයෝ.. පරඬලාවක් වගේ දුර්වල මනුස්සයෙක් වුණත් ගහක මුදුන් අත්තේම තියන්න ඔයාට තියෙන ශක්තිය ගැන මට අබමල් රේණුවක තරම් වත් සැකයක් නෑ.. "

ඇගේ වදන් ඔහු සිතේ සතුටක් ඇති කරයි.

"මාව විශ්වාස කරන්න.. එක පාරක් මාව විශ්වාස කරන්න.. මං දහස් වාරයක් ඒ විශ්වාසය රකිනවා..." ඔහු සිතින් කියන එවදන් ඈ ඔහුගේ දෑසින් දැක ගනියි. වදන් දහසකින් කිව නොහැකි සියල්ල එකම එක බැල්මකින් කියන්නට හැකි බව ඕ දනියි. මිනිසකුගේ ජීවිතය දෑසින් නොදැක ගන්නා කිසිම තීරණයක සාධාරණත්වයක් නැත යන්න වින්ධ්‍යා තරයේ විශ්වාස කරන්නේ එනිසාම ය.

එක්ව සිටින විට. ජීවිතය සුන්දර ය. ඒ සුන්දරත්වය වැනසී යන්නට ඉඩ දිය නොහැකිය. වින්ධ්‍යා ගියර ලීවරය මත රැඳුණ

*අනෙක් පිටුවට*